<u>නිපුණතාවය 04 - යෝග්‍ය ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ පූර්ව සූදානම ප්‍රදර්ශනය කරයි.</u>

නිපුණතා මට්ටම 4.2 - නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී වෙළඳපොළට පිවිසිය හැකි විකල්ප ක්‍රම හා උපාය මාර්ග විමසයි.

(පෙළපොතේ පිටු අංක 88 - 89 දක්වා හොඳින් කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.)

01) ව්‍යවසායකයන්ට වෙළඳපොළට පිවිසීමේදී අනුගමනය කිරීමට උචිත වන පිවිසුම් උපාය මාර්ග 4ක් නම් කරන්න.

02) ව්‍යාපාරිකයා ඉදිරිපත් කරන නිෂ්පාදිතය දැනටමත් වෙළඳපොළේ ඇති තරගකාරී නිෂ්පාදනයකින් වෙනස්ව ඉදිරිපත් කිරීමට නම් අවධානය යොමු කළ යුතු ලක්ෂණ 3ක් නම් කරන්න.

03) නිෂ්පාදිත ප්‍රභේදනය යනු කුමක්ද ? නිදසුනක් සහිතව විස්තර කරන්න.

04) වෙළෙඳපොළෙහි පාරිභෝගිකයන්ගෙන් කොටසක් තෘප්තිමත් නොවූ අවශ්‍යතා සහ වුවමනා සහිතව පසුවීම හඳුන්වන්නේ කුමන නමකින්ද ?

05) නවෝත්පාදනය යනු කුමක්ද ?

06) නවෝත්පාදනය සිදු කළ හැකි අවස්ථා නම් කරන්න.

07) දක්ෂ ව්‍යාවසායකයෙකුට ඉදිරිපත් කළ හැකි නව්‍යතා සඳහා නිදසුන් 5ක් ලියන්න.

08) පහත දැක්වෙන්නේ පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි උපායමාර්ග සඳහා නිදසුන් කීපයකි. එම නිදසුන් අදාළ වන උපායමාර්ගය නම් කරන්න.

a. පොලිතින් වෙනුවට හරිත ඇසුරුම් භාවිතය
b. ගණක යන්ත්‍රයක් සහිත අඩි කෝදුව
c. ප්‍රමාණ කීපයකින් යුක්තව සබන් කැට වොළෙඳපොළට ඉදිරිපත් කිරීම.
d. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් වැඩි පොළියක් සහිත ස්ථාවර තැන්පත් ගිණුම් ක්‍රම හඳුන්වා දීම.

09) පෙළපොතේ පිටු අංක 90 හි සඳහන් ක්‍රියාකාරකම් 04ට පිළිතුරු සපයන්න.

10) පෙළපොතේ පිටු අංක 90 හි සඳහන් "පිළිතුරු ලියමු" අභ්‍යාසයට පිළිතුරු සපයන්න.